# පුරාණ ආභරණ හෙළිකරන පුරාවිද්‍යාව

පී. ඒ. එස්. ප්‍රනාන්දු

පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
pasfernando6@gmail.com

---

අතීත සමාජ පිළිබඳව තොරතුරු හෙළිකරගැනීමේදී උපයෝගී කරගත හැකි ඉතා වටිනා පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස පුරාණ ආභරණ හඳුන්වාදිය හැකිය. මෙතෙක් අනාවරණය කරගෙන තිබෙන පුරාවිද්‍යාත්මක මෙන්ම සමාජවිද්‍යාත්මක සාධකයන්ට අනුව බලන කළ පුරාණ සමාජයන්හි ඇඳුමෙහි කොටසක් වශයෙන් ආභරණ පරිහරණය කළ ද, අතීතයේදී ප්‍රාග් මානවයා ඇඳුම් භාවිතයට පෙර ද ආභරණ පැළඳූ බව සොයාගෙන තිබේ. මානව ජීවිතය සමග විවිධ හැළ හැප්පීම්වලට ලක්වෙමින් ගොඩනැගුණු පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස ආභරණ හඳුන්වාදිය හැකිය. මිනිසා ආභරණ පරිහරණය ආරම්භ කළ අවධියේ පටන්ම ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව ශරීර අංග, ප්‍රත්‍යංග අලංකාර කිරීමට ආභරණ සාදාගත් බවට පුරාවිද්‍යාත්මක සාධක බහුලය. එමෙන්ම ආභරණ මිනිසුන්ගේ නොයෙකුත් අවශ්‍යතාවයන් හමුවේ විවිධ මුහුහුණුවරින් යුතුව සමාජයේ කැපී පෙනුණු පුරාකෘතියක් ලෙස හඳුන්වා දිය හැකිය.

පුරාණ ආභරණයන්ගෙන් හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක තොරතුරු රැසක් ඇත. එනම් පුරාවිද්‍යාත්මක කාලනිර්ණයන් සඳහා ආභරණ යොදාගත හැකිය. එහිදී මෝස්තර රටා සහ හැඩය අනුව ආභරණ අධ්‍යයනය කිරීමට හැකිවේ. මීට අමතරව පුරාවිද්‍යාත්මක ශ්‍රේණිගතකරණයන් සහ වර්ගීකරණයන් සඳහා ද ආභරණ යොදාගත හැකිය. තව ද පැරණි ජනයාගේ ආකල්ප සහ සංකල්ප අධ්‍යයන කිරීමටත් ආගමික හා අභිචාර විධික්‍රම හඳුනාගැනීමටත් පුරාතන තාක්ෂණය අධ්‍යයනය කිරීමටත් සමාජ සිරිත් විරිත් ක්‍රම හඳුනාගැනීමටත් තත්කාලීන සමාජ ස්තරායනය අධ්‍යයනයටත් විදේශීය සබඳතා සහ බලපෑම් අධ්‍යයනයටත් පුරාණ ආභරණ යොදාගත හැකිය. පුම්තිරිභාවය අනුව ඔවුන්ගේ භූමිකාව අධ්‍යයනයේදීත් පුරාණ ආභරණ භාවිත කළ හැකිය. මෙම අධ්‍යයනය සඳහා ලිඛිත මූලාශ්‍රය සහ පුරාවිද්‍යාත්මක සාධක පරිශීලනය ද අනතුරු ව ක්ෂේත්‍ර අධ්‍යයනයන් ද යොදාගනු ලැබිණි. ඒ අනුව පුරාණ ආභරණ අතීත තොරතුරු පිළිබඳව තතු හෙළි කරගත හැකි ඉතා වටිනා පුරාකෘති විශේෂයක් ලෙස සැලකිය හැකිය.

ප්‍රමුඛ පද : ආභරණ, පුරා කෘති, කාලනිර්ණය